(3)
00252

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2019

**ESD1133/EPD3233-**විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ (පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්)

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.03.02 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

## <u>1 වන කොටස</u>

01. “පරිසරය” යන්න ඔබේ වචනින් නිර්වචනය කරන්න.

02. ප්‍රාථමික පාසල් විෂයමාලාවේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය අනෙක් විෂයයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

03. 1972 ප්‍රතිසංස්කරණයේ දී පරිසර අධ්‍යයනය හඳුන්වා දීමේ අරමුණු දෙකක් (02) සඳහන් කරන්න.

04. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ හා සම්බන්ධ ක්ෂේත්‍ර චාරිකාවල වැදගත්කම විග්‍රහ කරන්න.

05. ප්‍රථමික පාසලේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේදී ගවේෂණය තුළින් සිසුන් ඉගෙන ගන්නේ කෙසේද යන්න උදාහරණයක් දෙමින් පැහැදිලි කරන්න.

06. ප්‍රාථමික පන්ති කාමරයේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේදී ගුරුවරයා විසින් ළමුන් තක්සේරු කරන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07. “පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය තුළින් සිසුන්ට වඩාත් දැනුම ලබාදීමට බලපෑමක් නැත”. ඔබ මෙම කියමන සමග එකඟ වන්නේ ද? හේතු ඉදිරිපත් කරන්න.

08. “ගුරුවරයා පහසුකම් සපයන්නෙකි.” මෙයින් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09.(a) පහත දැක්වෙන පද උචිත උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

(i) ආහාර දාමය

(ii) ආහාර ජාලය

(iii) නිෂ්පාදකයා

(iv) පළමුවන පාරිභෝගිකයා

(v) දෙවන පාරිභෝගිකයා

(vi) තුන්වන පාරිභෝගිකයා (ලකුණු 06)

(b) ආහාර දාමවල ප්‍රධාන කොටස් තුන (03) නම් කරන්න. ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) (i) පහත සඳහන් ජීවීන් නියෝජනය වන ආහාර ජාලයක් අඳින්න.

| |
|---|
| කුරුල්ලා, නාගයා, ගවයා, රාජාලියා, තණකොළ පෙත්තා<br>මිනිසා , මීයා, මුගටියා, වී, හාවුන් |

(ii) ඔබ අඳින ලද ආහාර ජාලයෙන් ආහාර දාම තුනක් හඳුනාගෙන නම් කරන්න.

(iii) ඔබේ ආහාර දාම සමූහයෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ආහාර දාමය | නිෂ්පාදකයා | පළමු පාරිභෝගිකයා | දෙවන පාරිභෝගිකයා | තුන්වන පාරිභෝගිකයා |
|---|---|---|---|---|
| ආහාර දාම 1 | | | | |
| ආහාර දාම 2 | | | | |
| ආහාර දාම 3 | | | | |

10. (I) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කළ හැකි ඉගැන්වීමේ ක්‍රම දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 04)

(II) ඉහත සඳහන් කළ ක්‍රමවලින් එකක් **(01)** තෝරාගෙන පහත සඳහන් දේ පැහැදිලි කරන්න.

(i) එම ක්‍රමයේ වැදගත්කම

(ii) එම ක්‍රමයේ ප්‍රබලතා සහ දුබලතා (ලකුණු 16)

11. (I) පරිසරය පිළිබඳ දාර්ශනික අදහස් තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(II) ඉහත සඳහන් කළ දාර්ශනික අදහස්වල ප්‍රාථමික ගුරුවරයකුට ඇති අදාළත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. (I) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා සම්බන්ධ සන්නිවේදන හැකියාවල මූලික සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(II) සිසුන්ගේ සන්නිවේදන නිපුණතා සංවර්ධනය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් පහක් **(05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04 )

(III) ඉහත සඳහන් කළ ඒවා අතරින් ඕනෑම එකක් **(01)** තෝරාගෙන උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12 )

13. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේදී පහත සඳහන් ඉගැන්වීමේ ක්‍රම භාවිතය සම්බන්ධයෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(i) අනාවරණ ක්‍රමය

(ii) ගැටලු විසඳීමේ ක්‍රමය

(iii) භූමිකා රංගන

(iv) ව්‍යාපෘති ක්‍රමය

( 4 x 5 = ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.